# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1993 අංක 36 දරන දෙහිවල කළුබෝවිල ශ්‍රී හත්බෝධි රජමහා විහාරස්ථ විද්‍යාරක්ෂක සභාව (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1993 අගෝස්තු මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1993 අගෝස්තු මස 20 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
**ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.**

**ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී**

---

**කොළඹ, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබා ගත හැක.**

මිල : ශත 60 යි.

තැපැල් ගාස්තුව : රු. 1.0

1993 අංක 36 දරන දෙහිවල කළුබෝවිල ශ්‍රී හත්බෝධි රජමහා විහාරස්ථ විද්‍යාරක්ෂක සභාව (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1993 අගෝස්තු මස 18 වන දින]

එල්. ඩී.—ඕ. 7/92

දෙහිවල කළුබෝවිල ශ්‍රී හත්බෝධි රජමහා විහාරස්ථ විද්‍යාරක්ෂක සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

"දෙහිවල කළුබෝවිල ශ්‍රී හත්බෝධි රජමහා විහාරස්ථ විද්‍යාරක්ෂක සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන සහ හඳුන්වනු ලබන සමිතියක්, ඒ සමිතියේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව, ඒ සමිතියට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ දෙහිවල, කළුබෝවිල පිහිටුවා තිබුණු හෙයින් ද: පූර්විකාව.

ඒ සමිතිය පිහිටුවන ලද්දේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද ඒ පරමාර්ථ සහ කරුණු ඒ සමිතිය විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ ඒ සමිතිය සංස්ථාගත කිරීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද, ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1993 අංක 36 දරන දෙහිවල කළුබෝවිල ශ්‍රී හත්බෝධි රජමහා විහාරස්ථ විද්‍යාරක්ෂක සභාව (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) දෙහිවල කළුබෝවිල ශ්‍රී හත්බෝධි රජමහා විහාරස්ථ විද්‍යාරක්ෂක සභාවේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කරගනු ලබන සාමාජිකයන්, "දෙහිවල කළුබෝවිල ශ්‍රී හත්බෝධි රජමහා විහාරස්ථ විද්‍යාරක්ෂක සභාව" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් වන අතර, පොදු මුද්‍රාවක් තබා ගෙන එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. තවද එකී සංස්ථාපිත නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය. දෙහිවල කළුබෝවිල ශ්‍රී හත්බෝධි රජමහා විහාරස්ථ විද්‍යාරක්ෂක සභාව සංස්ථාගත කිරීම.

3. සංස්ථාව සංස්ථාපනය කිරීමට අරමුණු කොට ගත් පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි වේ යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) ධර්මදූත හා ධර්ම ප්‍රචාරක සේවාවන් සම්බන්ධ ආගමික කටයුතු සංවිධානය කිරීම හා සම්බන්ධීකරණය කිරීම ;

(ආ) ශ්‍රී බෝධිරාජ දහම් පාසල පවත්වාගෙන යෑම සහ පාලනය කිරීම ;

(ඇ) ශ්‍රී හත්බෝධි රජමහා විහාරයට අවශ්‍ය ගොඩනැගිලි ඉදි කිරීම සහ ඒවා නඩත්තු කිරීම ;

(ඈ) ප්‍රදේශයේ බෞද්ධ දරු දැරියන්ගේ සහ තරුණ පරපුරේද, සමාජ හා සංස්කෘතික සුභසාධනය ඇති කිරීමට අවශ්‍ය වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම ;

(ඉ) ප්‍රදේශයේ ජනතාව සඳහා සහන සහ සුභසාධන කටයුතුවල නිරතවීම ;

(ඊ) ඉහත සඳහන් පරමාර්ථ ඉටුකර ගැනීම පිණිස අරමුදලක් ඇති කිරීම සහ පවත්වාගෙනයාම ;

(උ) පළාතේ ළදරුවන්ගේ ප්‍රයෝජනය සඳහා ළදරු පාසලක් පිහිටුවීම, පවත්වාගෙන යෑම ;

(ඌ) සභාවට අනුබද්ධ බෞද්ධ දහම් පාසැල් පිහිටුවීම සහ පවත්වාගෙන යාම ;

(ඔ) ජාත්‍යන්තර බෞද්ධ ධර්ම දූත සේවා ඇති කිරීම සහ ඒ සඳහා භික්ෂූන් වහන්සේලා පුහුණු කිරීම ;

(ඕ) පළාත් වාසීන්ගේ ප්‍රයෝජනය සඳහා පුස්තකාල සේවාවක් පිහිටුවීම සහ පවත්වාගෙන යෑම ;

(ඵ) සංස්ථාවේ පරමාර්ථ සියල්ලම හෝ ඉන් යම් කිසිවක් ඉටු කර ගැනීමට ආනුෂංගික හෝ හිතකර වෙනත් සියලු ක්‍රියා හෝ දේ කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, බැංකු ගිණුම් ආරම්භ කිරීම, ක්‍රියාත්මක කිරීම සහ වැසීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම, ආධාර මුදල් හා පරිත්‍යාග පිළිගැනීම හෝ එකතු කිරීම, සංස්ථාවේ අරමුදල් ආයෝජනවල යෙදවීම සහ සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීම, සේවයේ නියුක්ත කිරීම සහ සේවයෙන් නෙරපීම ද ඇතුළුව, සංස්ථාවේ සියළුම පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් හෝ ඉටු කර ගැනීම සඳහා සහ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කරුණු සහ දේ කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ කටයුතු සංස්ථාවේ නිලධරයන්ගෙන් තත් කාලයේ සංස්ථාවේ බලපවත්නා රීතිවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි සහ ඒ රීතිවලට අනුකූලව තෝරා පත්කර ගනු ලබන සෙසු තැනැත්තන්ගෙන් ද සමන්විත විධායක කාරක සභාවක් විසින් එකී රීතිවලට යටත්ව පරිපාලනය කළ යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දැරූ සමිතියේ විධායක කාරක සභාව, සංස්ථාවේ ප්‍රථම විධායක කාරක සභාව විය යුතු ය.

6. (1) සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන්, පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන්, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :— සංස්ථාවේ රීති.

(අ) සාමාජිකත්වය වර්ග කිරීම සහ සාමාජිකයන් ඇතුළු කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම ;

(ආ) නිලධරයන් තෝරා පත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම, ඔවුන් ධුරය අත්හැරීම හෝ ඔවුන් ධුරයෙන් පහ කිරීම සහ ඔවුන්ගේ බලතල, චර්යාව සහ කාර්ය ;

(ඇ) විධායක කාරක සභාවේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම සහ ඔවුන්ගේ බලතල, කාර්ය සහ චර්යාව සහ විධායක කාරක සභාවේ සාමාජිකයන්ගේ ධුර කාලය ;

(ඈ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, චර්යාව, කාර්ය සහ කර්තව්‍ය ;

(ඉ) විධායක කාරක සභාවේ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, ඒ රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම, ඒ රැස්වීම් පවත්වන වේලාවල්, ස්ථාන සහ ඒ රැස්වීම් පිළිබඳ දැන්වීම් හා ඒ රැස්වීම්වල න්‍යාය පත්‍ර සහ ගණපූරණය සහ ඒ රැස්වීම්වල දී සාකච්ඡාවට භාජනය කළ යුතු කරුණු ;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම, සංස්ථාවේ අරමුදල්වල භාරකාරත්වය සහ සංස්ථාවේ ගිණුම් පවත්වාගෙන යාම සහ ඒවා විගණනය කිරීම ; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක්, (1) වන උප වගන්තිය යටතේ රීතියක් සාදනු ලැබිය හැකි ආකාරයෙන්ම එවැනිම රැස්වීමක දී සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සභාවේ බලපැවැත්වූ රීති, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට මේ වගන්තිය යටතේ සාදනු ලැබූ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ සියලු සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සභාවෙන් ගෙවිය යුතු සහ සභාවට අයවිය යුතු ණය.

7. මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි පැවති සභාවේ සියලුම ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර එදිනට සභාවට අය විය යුතු හෝ ගෙවිය යුතු සියලු ණය, දායක මුදල් සහ සාමාජික මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

8. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ සංස්ථාව සතු වන්නා වූ චංචල හෝ නිශ්චල යම් දේපළක් භාර ගැනීමට සහ දැරීමට සංස්ථාවට නීතියෙහි ලා බලය ඇති අතර, ඒ සියලු දේපළ විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට සම්පූර්ණ බලය සහිතව සංස්ථාවේ තත්කාලයේ බලපවත්වන රීතිවලට යටත්ව, මේ පනතේ කාර්යය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

9. සංස්ථාවේ සභාපතිවරයා සහ ලේකම්වරයා හෝ භාණ්ඩාගාරිකවරයා ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර ඔවුන් විසින් තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කරනු ලැබිය යුතු ය. ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සනට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

10. මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම් වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුලත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු බව.

11. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 07, බෞද්ධාලෝක මාවත, අංක 255, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.